මධ්‍යම පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ විමර්ශන නිළධාරි - විශේෂ ශ්‍රේණිය නිලධර ගණය (MN – 07 – 2016) සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරනු ලබන දින සිට මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වේ.

01. සම්බන්ධවන ආයතන

01.1 මධ්‍යම පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව: -
යොමු අංකය: CPC/CLG/1/4/5/2 දිනය:2015.12.07

01.2 මධ්‍යම පළාත්,අධ්‍යාපන හා ප්‍රධාන අමාත්‍යාංශය:-
යොමු අංකය: CPC/CMS/01/07/07 දිනය:2015.12.21

01.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම:-
යොමු අංකය: DMS/D1/පොදු දිනය:2012.12.19

01.4 මධ්‍යම පළාත්, ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය:
යොමු අංකය: CPC/CS/2/3/SM/C(V) දිනය: 2016.01.27

01.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය:-
යොමු අංකය: NSCC/10/P/GE/SR/2 දිනය: 2017.01.30

02. පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තර

02.1 පත් කිරීම් බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. නිලධර ගණය පිළිබඳ විස්තර :

03.1 නිළධර ගණය : විමර්ශන නිලධාරි -අධි පන්තිය(ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි)

03.2 ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

03.3 පැවරෙන කාර්යය පිළිබඳ පොදු නිර්වචනය :

පළාත් පාලන ආයතන වන මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වලට එකී අඥා පනත් වලින් ද ඊට සම්බන්ධවන අනෙකුත් ආඥා පනත්, රීති, ප්‍රඥප්ති, අතුරු ව්‍යවස්ථාවන් මඟින් පැවරී ඇති කාර්යභාරය නීති රීති වලට අදාළව ඉටු කරවීම සඳහා එකී ආයතනවලට පත් වී ඇති මහජන නියෝජිතයින් හා කාර්ය මණ්ඩලය වෙත උපදෙස් දීම, මග පෙන්වීම, සහාය වීම හා අධීක්ෂණය කිරීම, මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත හා ප්‍රාදේශීය සභා පනත හා ඊට අනුෂාංගික වෙනත් අණපනත් වලින් පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාට, පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් වරයාට, පළාත් පාලන කොමසාරිස්වරයාට සහ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාට පැවරී ඇති නෛතික බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහය වීම හා සම්බන්ධීකරණය සඳහා ක්ෂේත්‍රගතව රාජකාරි ඉටු කිරීම මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් වේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017 . 04 . 06 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

04. තනතුරේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

05. වැටුප් :

05.1 වැටුප් කේත අංකය : MN 07-2016

05.2 වැටුප් පරිමාණය : රු. 41,580 -755 x 11- 1030 x 18 - 68,425/-

05.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | 05 | 44,600/- |

05.4 වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතුය.

06. නිළධර ගණයට අයත් තනතුර / තනතුරු :

06.1 අනුමත තනතුරු නාමය, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | අනුමත සංඛ්‍යාව | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ විමර්ශන නිළධාරී | 03 | පළාත් පාලන ආයතනවලට අදාළ ප්‍රධාන නීති හා උප නීති අනුව පැවරී ඇති කාර්යභාරය එකී නීති හා උප නීති වලට අදාළව ඉටු කරවීම සඳහා,<br>• මහජන නියෝජිතයන් හා කාර්ය මණ්ඩල වෙත උපදෙස් දීම, මග පෙන්වීම හා සහය වීම.<br>• එම ආයතනවල කටයුතු අධීක්ෂණය කිරීම.<br>• විෂයභාර අමාත්‍යවරයාට, එම අමාත්‍යාංශයේ ලේකම්වරයාට, පළාත් පාලන කොමසාරිස්වරයාට සහ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාට පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම සඳහා ක්ෂේත්‍රගත රාජකාරි ඉටු කිරීම. |

06.2 ඒකාබද්ධ නිළධර සංඛ්‍යාව : 03 යි.

07. බඳවා ගැනීමේ ක්‍රමය :

07.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | - |
| කුසලතා | 100% |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017.04.06 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

07.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ.

07.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

07.4 කුසලතාවය මත බඳවා ගැනීම

07.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විමර්ශන නිළධාරී විශේෂ ශ්‍රේණිය

07.4.2 සුදුසුකම් :

07.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : අදාළ නොවේ.

07.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

07.4.2.3 පළපුරුද්ද : නිලධර ගණයේ I ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා උසස්වීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක 05 ක් උපයාගෙන තිබීම.

07.4.2.4 කායික සුදුසුකම් :
සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

07.4.2.5 වෙනත් :

07.4.2.5.1 මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතුය.

07.4.2.5.2 අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර (05) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

07.4.2.5.3 උසස් කිරීමේ දිනට පූර්වාසන්තම වසර (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

07.4.2.5.4 නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත කාලය තුළ සමත්වී තිබීම හෝ පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ එක් අවුරුදු උසස් ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

07.5 වයස :

07.5.1 අවම සීමාව : අදාළ නොවේ
07.5.2 උපරිම සීමාව : අදාළ නොවේ

07.6 බඳවා ගැනීමේ ක්‍රමය :

ලිඛිත පරීක්ෂණයක හා සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණු ප්‍රමුඛතාවමය අනුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ.

07.6.1 ලිඛිත විභාගය :ඇමුණුම - 01

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | විෂය නිර්දේශය |
|---|---|---|---|
| 1. පළාත් පාලන ආයතනවල ගිණුම් ක්‍රම | 100 | 50% | ඇමුණුම 01 |
| 2. පළාත් පාලන නීතිය | 100 | 50% | |

07.6.1.1 විභාගය පවත්වන බලධාරියා :- මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017.04.06 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

07.6.2 සම්මුඛ පරීක්ෂණය : (ඇමුණුම 02)

07.6.2.1 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධාරියා - මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

සටහන : ලිඛිත පරීක්ෂණයෙන් සමත්වන සියලුම අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

07.7 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර නිවේදනයක් මඟින්

08. කාර්යක්ෂමතා කඩඉම් : උසස් වීමේ ශ්‍රේණියක් වන බැවින් අදාළ නොවේ.

09. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය : උසස් වීමේ ශ්‍රේණියක් වන බැවින් අදාළ නොවේ.

10. ශ්‍රේණි උසස් කිරීම් : අදාළ නොවේ

11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ

12. අන්තර්කාලීන විධිවිධාන :(මෙම බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන්ට එක් වරක් පමණක් අදාලවන පරිදි ක්‍රියාත්මක වේ) .

පළාතේ විමර්ශන නිලධාරී සේවයේ, සේවයේ යෙදී සිටින වසර පහක (05 ක) කාලයක් තුළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 (IV) –MN 04 වැටුප් පරිමාණයේ I ශ්‍රේණියට අදාළ වැටුප් ලබමින් පූර්වාසන්න වසර 05ක අඛණ්ඩ හා සක්‍රිය සේවා කාලයක් සපුරා ඇති හා නියමිත පරිදි කාර්යක්ෂමතා කඩඉම් සමත් හෝ කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරන ලද, නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවා ජ්‍යෙෂ්ඨතාවයේ අනුපිළිවෙලට මධ්‍යම පළාතේ විමර්ශන නිලධාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ (ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරී) තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාවට 2013.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් කරනු ලැබේ. පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අයැදුම්කරුවන් පෙනී සිටින්නේ නම් පමණක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදුකර ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාවය අනුව පවතින පුරප්පාඩු සඳහා උසස් කෙරේ. ලකුණු ලබා දීමේ ක්‍රමවේදය ඇමුණුම 03 හි දැක්වේ. මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන අවශ්‍ය ලිපිලේඛණ හා විස්තර සැපයීමට ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කළ යුතුය.

13. ආයතන සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ :

13.1 ආණ්ඩුකාරතුමිය යනු මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමිය හෝ තුමා වේ.

13.2 "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ.රජයේ අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන මුදල් රෙගුලාසි මධ්‍යම පළාත් මූල්‍ය රීති සහ රජය/ මධ්‍යම පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීති රීති හා රෙගුලාසි අදාළ වේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017 . 04 . 06 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

15. මෙම බඳවා ගැනීමේ පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව අවශ්‍ය වන්නේ නම් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා, ගරු ආණ්ඩුකාරතුමිය විසින් තීරණය කරනු ලැබේ.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය -: නිර්දේශ කරමු.

| | | |
|---|---|---|
| 01. ගාමිණී දසනායක මහතා | (සභාපති) | ........................ |
| 02. යූ.ඒ. බෝගහපිටිය මහතා | (සාමාජික) | ........................ |
| 03. ජී.ජී.එස්.ඒ. දිසානායක මිය | (සාමාජික) | ........................ |
| 04. වී. නන්දකුමාර් මහතා | (සාමාජික) | ........................ |
| 05. ඒ.ජේ.එම්.එම්. නිස්තාර් මහතා | (සාමාජික) | A.J.M.M. Nisthar |

දිනය 2017 - 02 - 21

ආණ්ඩුකාර ලේකම්,

2017 - 02 - 21 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 17/279 යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් විමර්ශන නිළධාරී - විශේෂ ශ්‍රේණිය නිලධර ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2017.03.22

..........................................
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා
කොමිෂන් සභාව
නිල මුද්‍රාව

ආර්. එම්. එන්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය :-

අනුමත කරමි / ~~නොකරමි~~

..........................................
නිලූකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2017-04-06

ඇමුණුම - 01

විමර්ශන නිලධාරි I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ විමර්ශන නිලධාරි තනතුරට උසස්වීම් කිරීමේ විභාගය

1.විභාගය පිළිබඳ විස්තර:

| ප්‍රශ්ණ පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. පළාත් පාලන ආයතනවල ගිණුම් ක්‍රමය | පැය 03 | 100 | 50% |
| 2. පළාත් පාලන නීතිය | පැය 03 | 100 | 50% |

| ප්‍රශ්ණ පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. පළාත් පාලන ආයතනවල ගිණුම් ක්‍රමය | පළාත් පාලන ආයතනවල ගිණුම් ක්‍රමය, රජයේ ගිණුම්කරණ ප්‍රමිති, පළාත් පාලන ආයතනවලට අදාල මූල්‍ය හා පරිපාලන රීති පිළිබඳ දැනුම විමසා බැලේ. |
| 2. පළාත් පාලන නීතිය | පළාත් පාලන ආයතනවලට අදාල ප්‍රධාන අනපනත්, රැස්වීම් පිළිබඳ රීති හා අතුරු ව්‍යවස්ථා පිළිබඳව දැනුම විමසා බැලේ. |
| | එමෙන්ම ගෝඝාතක ආඥා පනත, විනෝද බදු ආඥා පනත, සුසාන භූමි හා මිනී පිටි ආඥා පනත, ආහාර පනත, දේපල සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යන අනපනත්වලින් පළාත් පාලන ක්ෂේත්‍රයට අදාලවන කොටස් පිළිබඳව දැනුම විමසා බැලේ. |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

4. අවශ්‍යතාවය පරිදි, පුරප්පාඩු ඇති වන අවස්ථාවන්හිදී විභාගය පවත්වනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017.04.06 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම - 02

## සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු |
|---|---|---|
| 01. සේවා කාලය<br><br>මධ්‍යම පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ I ශ්‍රේණියේ විමර්ශන නිලධාරියෙකු වශයෙන් වසර පහක (05) සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුව සේවය කර ඇති ඇති එක් වසරක් සඳහා ලකුණු 05 බැගින් හා වසරකට අඩු එහෙත් මාස 06 කට වැඩි කාලසීමාවක් සඳහා ලකුණු 2.5 බැගින් | 60 | අදාළ නොවේ. |
| 02. කුසලතාවය<br><br>පූර්වාසන්න වසර 05 සඳහා වූ කාර්ය සාධන ඇගයීම් වාර්තා<br><br>විශිෂ්ඨ බව - එක් වසරකට ලකුණු 03 බැගින්<br>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - එක් වසරකට ලකුණු 02 බැගින්<br>සතුටුදායක - එක් වසරකට ලකුණු 1 බැගින් | 15 | |
| 03. සේවා ගණයේ සේවා කාලය තුළ සේවා ඇගයීම් සඳහා පොදු 230 ආකෘතිය පරිදි ලබා දෙන ලද ප්‍රශංසා ලිපි සඳහා ලකුණු 1 බැගින් උපරිම ලකුණු 05 යි | 05 | |
| 04. පළාත් පාලනය පිළිබඳ පාඨමාලා<br><br>I. පළාත් පාලනය පිළිබඳ එක් අවුරුදු උසස් ඩිප්ලෝමාව - ලකුණු 10<br>II. පළාත් පාලනය පිළිබඳ සය මාසික පාඨමාලාව - ලකුණු 05 | 10 | |
| 05. ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති සහ වෘත්තීය මට්ටමින් නිර්මාණශීලීව ක්‍රියාත්මක කළ වැඩ සටහන් | 05 | |
| 06. භාෂා හැකියාව<br>පිළිගත් ආයතනයක හදාරන ලද අනෙක් රාජ්‍ය භාෂාවේ සහ සන්ධාන භාෂාවේ,<br><br>I. ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 05<br>II. සහතිකපත්‍ර පාඨමාලා සඳහා - ලකුණු 02 | 05 | |
| එකතුව | 100 | |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017.04.06 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම -03

ජ්‍යෙෂ්ඨ විමර්ශන නිළධාරී තනතුරට උසස් කිරීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය.

| ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| 1. ජ්‍යෙෂ්ඨතාවය<br><br>විමර්ශන නිළධාරී සේවයේ වසර 15 ක සේවා කාලය ඉක්මවූ පසු වසරකට ලකුණු 05 බැගින් හා වසරකට අඩු එහෙත් මාස 06 කට වැඩි කාලසීමාවක් සඳහා ලකුණු 2.5 බැගින් | 60 | |
| 2. කුසලතාවය<br><br>පූර්වාසන්න වසර 05 සඳහා අදාළ වූ කාර්ය සාධන ඇගයීම් වාර්තා<br><br>විශිෂ්ඨ බව - වසරකට ලකුණු 03 බැගින්<br>සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ - එක් වසරකට ලකුණු 02 බැගින්<br>සතුටුදායක - එක් වසරකට ලකුණු 01 බැගින් | 15 | |
| 3. සේවා ගණයේ සේවා කාලය තුළ සේවා ඇගයීම් සඳහා පොදු 230 ආකෘතිය පරිදි ලබා දෙන ප්‍රශංසා සඳහා උපරිම ලකුණු 5 බැගින් | 05 | |
| 4. වෘත්තීය/ක්ෂේත්‍රයට අදාළ වන පාඨමාලා හදාරා තිබීම.<br><br>මාස 03 කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා - ලකුණු 02 යි<br>මාස 6 කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - ලකුණු 03 යි<br>පශ්චාත් උපාධි පාඨමාලාවක් සඳහා - ලකුණු 05 යි | 10 | අදාළ නොවේ. |
| 5. ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාත්මක කරන ලද විශේෂ ව්‍යාපෘති හා වෘත්තීය මට්ටමෙන් නිර්මාණශීලීව ක්‍රියාත්මක කළ වැඩසටහන් | 05 | |
| 6. භාෂා ප්‍රවීණතාව .<br><br>පිළිගත් ආයතනයක හදාරන ලද අනෙක් රාජ්‍ය භාෂාවේ සහ සන්ධාන භාෂාවේ,<br><br>I. ඩිප්ලෝමාවක් සඳහා - ලකුණු 05 යි<br>II. සහතික පත්‍ර පාඨමාලා සඳහා - ලකුණු 02 යි | 05 | |
| එකතුව | 100 | |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017.04.06 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්